**<u>Free school bus service starts with passenger bus donated by People's Leasing to Seruwila</u>**

People’s Leasing donated a passenger bus to Seruwila Community Development Foundation as a CSR project to overcome the difficulties faced by Seruwila school children when travelling to school.

Recently the new bus service has been handed over to the use of school children under the guidance of Ven.Aludeniye Subodhi Thero, the Chief Incumbent of the Seruwila Mangala Rajamaha Vihara and Chairman of Seruwila Community Development Foundation.

The foundation runs this bus service at a free of charge as a noble social care. This bus service covers many areas like Sumedhankarapura, Seruwila, Nelumgama, Kawantissapura, Mahindapura, Somavathy Road, Arippu Junction etc. Over 200 school children from Seruwila Maha Vidyalaya, Seruwila Primary School, Mahaweligama Primary School and Mahaweligama Primary School will be benefitted from this service.

This initiative was taken by PLC by taking into consideration the hardship faced by the students of the area due to lack of transportation and the threat they face from wild elephants when they walk to school.

The project was highly appreciated by the Seruwila community.







සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15

**<u>පීපල්ස් ලීසිං සමාගමෙන් සේරුවිලට පරිත්‍යාග කරන ලද මගී බස් රථයේ නොමිලේ පාසල් බස් රථ සේවාව ඇරඹේ.</u>**

සේරුවිල අවට ප්‍රදේශයන්හි පාසල් සිසුන්ට, දෛනිකව පාසල් යාමේදී මුහුණ දීමට සිදුවන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා පීපල්ස් ලීසිං සමාගමේ සමාජ සත්කාර ව්‍යාපෘතියක් ලෙස සේරුවිල ප්‍රජා සංවර්ධන පදනමට පරිත්‍යාග කරන ලද මගී බස් රථයේ අභිනව මංගල ගමන්වාරය පසුගියදා එම ගම්වාසීන්ගේ දූදරුවන්ගේ සහභාගීත්වයෙන් සිදුවිය.

සේරුවිල මංගල රජමහා විහාරාධිපති හා සේරුවිල ප්‍රජා සංවර්ධන පදනමේ සභාපති පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන්වහන්සේට නිළ වශයෙන් භාරදුන් මෙම බස් රථය උන්වහන්සේගේ අනුශාසනාව හා මගපෙන්වීම මත පාසල් සිසුන්ගේ පරිහරණය සඳහා සිසු අයිතියට පත් කර ඇත.

ඒ අනුව, සේරුවිල ප්‍රජා සංවර්ධන පදනම හරහා මෙම බස් රථ ප්‍රවාහන සේවාව උතුම් සමාජ සත්කාරයක් ලෙස ඉදිරියේදී නොමිලයේ ප්‍රදේශවාසි සිසුන්ට පවත්වාගෙන යනු ලබයි. සුමේධංකරපුර, සේරුවිල, නෙලුම්ගම, කාවන්තිස්සපුර, මහින්දපුර, සෝමාවතී පාර සහ අරිප්පු හන්දිය ආදී දුෂ්කර ගම්මාන රැසක් ආවරණය වන පරිදි මෙම බස් රථ සේවාව සිසු දරුවන්ට දෛනිකව ක්‍රියාත්මක වේ. සේරුවිල මහා විද්‍යාලය, සේරුවිල ප්‍රාථමික විද්‍යාලය, වැලිගම විද්‍යාලය සහ මහවැලිගම ප්‍රාථමික විද්‍යාලය යන විද්‍යාලයන්හි ඉගෙනුම ලබන 200 කට අධික සිසු දරුවන්ට මෙම පහසුකම හරහා යහපත සැළසේ.

සේරුවිල ප්‍රදේශය අවට වන අලි තර්ජනයෙන් පීඩා විඳින සිසු සිසුවියන්ට අලිමංකඩවල් හරහා පාගමනින් සහ පාපැදි වලින් පාසල් යෑමට සිදුව තිබූ අවහිරතාවට පිළියමක් ලෙස පීපල්ස් ලිසිං සමාගමේ පූර්ණ මූල්‍ය දායකත්වයෙන් සිදු වූ මෙම ව්‍යාපෘතිය සේරුවිල ප්‍රජාවගේ ඉමහත් ප්‍රසාදයට ලක්විය.







සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15


සේරුවිල පාසල් බස් රථ සේවාව ඇරඹෙයි.
PEOPLE'S LEASING
2022-09-15